# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2196/2 – 2020 ඔක්තෝබර් මස 05 වැනි සඳුදා – 2020.10.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2020 අංක 156 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/9/2018/WS/218.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: VE/DS/LA/AQ/WS/218.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් අමාත්‍ය සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

2020 සැප්තැම්බර් මස 29 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය**

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, වේලනෙයි.

2. **ඉඩමේ විස්තරය. –** උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, දිවයින දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, J/13, වේලනෙයි ඊසාන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, වේලනෙයි නැගෙනහිර ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Ya/VLN/2019/22 හා 2019.11.22 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – නොච්චික්කාඩු – ප්‍රමාණය: හෙක්. 0.1478 ක් පමණ**

උතුරට: නොච්චික්කාඩු ලංකා විදුලිබල මණ්ඩලය, තීතන්කුඩල් ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය සහ තීතන්කුඩල් රත්නසභාපති සහ තවත් අය; නැගෙනහිරට: තීතන්කුඩල් රත්නසභාපති සහ තවත් අය සහ තීතන්කුඩල්, රජය; දකුණට: තීතන්කුඩල් රත්නසභාපති සහ තවත් අය, තීතන්කුඩල් රජය සහ පාර (ප්‍රාදේශීය සභා); බටහිරට: පාර (ප්‍රාදේශීය සභා), නොච්චික්කාඩු ලංකා විදුලිබල මණ්ඩලය සහ තීනන්කුඩල් ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය.

10 – 755

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2020 අංක 155 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/9/2017/WS/146.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: KDS/UNU/4/6/LA/63/2016.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් අමාත්‍ය සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

2020 සැප්තැම්බර් මස 29 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා:** ප්‍රාදේශීය ලේකම්, උඩුනුවර.

2. **ඉඩමේ විස්තරය:** මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඳුපලාත කෝරළේ (උඩු නුවර) සුළු කොට්ඨාසයේ, බැලුම්ගල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Maha/UDN/2017/679 හා 2018.04.23 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – බැලුම්ගලවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0036 ක් පමණ**

උතුරට: මාර්ගය සහ මෙම ඉඩමේ ඉතිරි කොටස; නැගෙනහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස; දකුණට: කැබලි අක්ෂර B සහ මෙම ඉඩමේ ඉතිරි කොටස; බටහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස සහ මාර්ගය.

02. **කැබලි අක්ෂර 'B' – බැලුම්ගලවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0271 ක් පමණ**

උතුරට: මෙම ඉඩමේ ඉතිරි කොටස සහ කැබලි අක්ෂර A; නැගෙනහිරට, දකුණට සහ බටහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස.

10 – 756

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.